"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු"

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**
**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**
**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

ISO 9001
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/FIN-AP/03/FI/01
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.
දිනය / திகதி / Date 2023.06. 14

## මූල්‍ය චක්‍රලේඛ 11/2023

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
ව්‍යවස්ථාපිත අධිකාරිවල සභාපතිවරු (බ.ප.).

### තක්සේරු දෙපාර්තමේන්තුව විසින් දැනට අය කරනු ලබන තක්සේරු ගාස්තු සංශෝධනය කිරීම.

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2023.05.19 දිනැතිව "තක්සේරු දෙපාර්තමේන්තුව විසින් දැනට අයකරනු ලබන තක්සේරු ගාස්තු සංශෝධනය කිරීම " සම්බන්ධයෙන් නිකුත් කරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2023 චක්‍රලේඛයෙහි පිටපතක් මේ සමඟ අමුණා ඇත.

02. ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2023.06.09 දිනැති ලිපිය මඟින් ඉහත චක්‍රලේඛයෙහි සඳහන් විධිවිධාන බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව දැනුම් දී ඇත. එහෙයින් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත: 01.විගණකාධිපති
02.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
03.තොරතුරු තාක්ෂණ නිලධාරී.

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No: PFD/RED/REG/CRC/2023/02
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2023.05.19

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 03/2023

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
පළාත් පාලන ආයතන ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය බැංකු, විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රධානීන් සහ
රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත

**<u>තක්සේරු දෙපාර්තමේන්තුව විසින් දැනට අයකරනු ලබන තක්සේරු ගාස්තු සංශෝධනය කිරීම</u>**

තක්සේරු දෙපාර්තමේන්තුවේ හිඟ තක්සේරු ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් පරීක්ෂා කර වාර්තා කිරීමට පත් කරන ලද කමිටුවේ වාර්තාව සඳහා 2023.03.27 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇත.

02. ඒ අනුව, "පළාත් සභා, පළාත් පාලන ආයතන හා භාණ්ඩාගාරයේ මූල්‍යාධාර මත යැපෙන ව්‍යවස්ථාපිත ආයතන වෙත ගාස්තු අයකිරීමකින් තොරව තක්සේරු සේවා සැපයීම" යන මැයෙන් නිකුත් කර ඇති 2008.12.31 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 434 මෙම චක්‍රලේඛය මඟින් අවලංගු කෙරෙන අතර රජයේ ආයතනවලට රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන තක්සේරු සේවා සඳහා ගාස්තු අයකිරීම 2023.06.01 දින සිට පහත සඳහන් පරිදි සිදුවිය යුතු ය.

**02.1. රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා සහ ඒ යටතේ ඇති අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල තක්සේරු ගාස්තු**

රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා සහ ඒ යටතේ ඇති අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් තක්සේරු ගාස්තු අය නොකෙරේ.

**02.2. පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය බැංකු සහ වෙනත් ව්‍යවස්ථාපිත ආයතනවල තක්සේරු ගාස්තු**

(අ) මහා භාණ්ඩාගාරයේ මූල්‍යාධාර මත නොයැපෙන රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය බැංකු සහ වෙනත් ව්‍යවස්ථාපිත ආයතන වෙත සපයනු ලබන තක්සේරු සේවාවන් සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2023.03.27 දිනැතිව අනුමත කරන ලද තක්සේරු ගාස්තු ව්‍යුහය යටතේ වන සම්පූර්ණ තක්සේරු ගාස්තුව අයකිරීමට තීරණය කර ඇත.

(ආ) පළාත් පාලන ආයතන (වර්පනම් කටයුතු සඳහා හැර) සහ මහා භාණ්ඩාගාරයේ මූලාධාර මත යැපෙන රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා ව්‍යවස්ථාපිත ආයතන වෙත සපයන තක්සේරු සේවාවන් සඳහා ඉහත 02.2 (අ) හි සඳහන් කර ඇති තක්සේරු ගාස්තු ව්‍යුහය යටතේ අය කෙරෙනු ලබන ගාස්තුවෙන් 50%ක මුදලක් තක්සේරු ගාස්තු ලෙස අය කෙරෙනු ඇත.

(ඇ) පළාත් පාලන ආයතනවල වර්පනම් කටයුතු සඳහා සමස්ථ දේපළවල ප්‍රතිශෝධිත මුළු වාර්ෂික වටිනාකම පදනම් කර ගනිමින් තක්සේරු ගාස්තුවක් අය කරනු ලබන අතර තක්සේරු ප්‍රතිශෝධන ගොනු සහ තක්සේරු ගොඩනැගිලි ගොනු සඳහා ද ගාස්තුවක් අයකරනු ඇත.

02.3. පළාත් සභා යටතේ ඇති ව්‍යවස්ථාපිත ආයතනවල තක්සේරු ගාස්තු

(අ) වාණිජමය ආයතන

පළාත් සභා යටතේ පවතින, පළාත් සභා ප්‍රඥප්ති මගින් සංස්ථාපිත වාණිජමය ආයතනවලින් ඉහත 02.2 (අ) පරිදි තක්සේරු ගාස්තු අයකරනු ලැබේ.

(ආ) වාණිජමය නොවන ආයතන

පළාත් සභා යටතේ පවතින, පළාත් සභා ප්‍රඥප්ති මගින් සංස්ථාපිත වාණිජමය නොවන ආයතනවලින් ඉහත 02.2 (ආ) පරිදි තක්සේරු ගාස්තු අයකරනු ලැබේ.

02.4 ආයෝජන ව්‍යාපෘති

එක් එක් ආයතන යටතේ ක්‍රියාත්මක වන විශේෂ ආයෝජන ව්‍යාපෘති සම්බන්ධයෙන් වූ අත්තිකාරම් මුදල අයකළ පසු අදාළ ව්‍යාපෘතිය සඳහා ආයෝජකයින් ඉදිරිපත් වූයේ නම් පමණක් ඉතිරි තක්සේරු ගාස්තුව අයකළ යුතු ය.

පොදු උපදෙස්

03. යම් ප්‍රාග්ධන දේපළක් හෝ කුලී තක්සේරු දේපලක් වෙනුවෙන් තක්සේරු වාර්තාවක් ලබාගෙන වසර 03ක් ඇතුළත එම දේපළ වෙනුවෙන්ම නැවත තක්සේරු වාර්තාවක් ඉල්ලුම් කරන්නේ නම්,

i. එකී දේපළෙහි තක්සේරු වටිනාකම, පෙර තක්සේරු වටිනාකමට සමාන වන්නේ නම්, පෙර තක්සේරු වටිනාකම මත තක්සේරු ගාස්තු ගණනය කර ඉන් 50% ක් පමණක් අය කළ යුතු ය.

ii. නව තක්සේරු වටිනාකම පෙර තක්සේරු වටිනාකමට වඩා වෙනස් වන්නේ නම්, ඉහත i හි සඳහන් කළ තක්සේරු ගාස්තුවට අමතරව, පෙර තක්සේරු වටිනාකම හා නව තක්සේරු වටිනාකම අතර වෙනස පදනම් කරගනිමින් තක්සේරු ගාස්තු ව්‍යුහය මත ගණනය කරනු ලබන සම්පූර්ණ තක්සේරු ගාස්තුව ද ඇතුළත් කළ යුතු ය.

04. තක්සේරු සේවය ලබා ගන්නා, මහා භාණ්ඩාගාරයේ මූලාධාර මත යැපෙන රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා ව්‍යවස්ථාපිත ආයතන විසින් ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් අදාළ වැය විෂයයන් යටතේ අවස්ථාවෝචිතව ප්‍රතිපාදන සළසාගත යුතු ය.

05. 02.2 (අ) හා (ආ) යටතේ සඳහන් ගාස්තු අය කිරීමට යටත්වන ආයතන ලැයිස්තු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලබාදෙනු ඇත. එම ලැයිස්තුවලට ඇතුළත් වී නොමැති ආයතනයක් සම්බන්ධ තක්සේරුවක් වන විට එම ආයතන කුමන ලැයිස්තුවකට ඇතුළත් කළ යුතු ද යන්න සම්බන්ධයෙන් රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් විමසා ඒ අනුව අදාළ තක්සේරු ගාස්තු අයකළ යුතු ය. එම තීරණයෙන් අතෘප්තියට පත්වන ආයතනයක් වෙතොත් ඒ සම්බන්ධව මහා භාණ්ඩාගාරයේ ලේකම් ට අභියාචනයක් ඉදිරිපත් කළ හැක.

06. තක්සේරු දෙපාර්තමේන්තුව විසින් එක් එක් පළාත් සභාවේ ප්‍රධාන ලේකම් විමසා 02.3 (අ) හා (ආ) යටතේ සඳහන් ගාස්තු අය කිරීමට යටත්වන ආයතන ලැයිස්තු සකස් කර ගත යුතු ය.

07. අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද තක්සේරු ගාස්තු ව්‍යූහය, අවම හා උපරිම තක්සේරු ගාස්තු ප්‍රමාණ, අත්තිකාරම් ප්‍රමාණ, අත්තිකාරම් මුදල් හා තක්සේරු ගාස්තු අයකරනු ලබන ආකාරය සහ තක්සේරු සේවය සැපයීමට ගිවිසුම්ගත වීම යන කරුණු සම්බන්ධ විස්තරාත්මක උපදෙස් ඉදිරියේදී රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් එම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළකිරීමට කටයුතු කරනු ඇත.

08. මේ පිළිබඳව වැඩිදුර තොරතුරු අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 011-2034508 මගින් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ, එච්.ඩී.ඩී.පී. කරුණාරත්න මිය ඇමතිය හැකි ය.

ඒ.කේ. සෙනවිරත්න
වැඩබලන භාණ්ඩාගාර ලේකම්

පිටපත්:
01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. විගණකාධිපති
05. රජයේ ප්‍රධාන තක්සේරුකරු